# SOCIO-CULTURAL FEATURES OF EARLY INGENOUS DOCUMENTRY FILMS (A STUDY OF A TRIO OF SELECTED DOCUMENTIRES)

Deepthika Abeysinghe[1]

**Abstract**

The documentary realistically presents reality, embodying contemporary society, culture, people's lives, the natural environment, and local identities. The beginning of local documentary filmmaking is often traced back to the 1935 film Song of Ceylon. In this study, we explore whether early documentaries exhibit socio-cultural characteristics. The purpose of this research is to examine the contribution of documentary films in portraying social and cultural characteristics. To do so, we conducted a content analysis of three selected documentaries: Song of Ceylon by Basil Wright, Hill Capital by Giulio Petroni and Nelumgama by Ralph Keene. In our analysis of social characteristics, we identified social patterns and methods used in these documentaries, specifically how they represented aspects of livelihood, education, transportation, communication, entertainment, politics, and administration in the early 20$^{th}$ century. In our investigation of cultural characteristics, we explored faiths and beliefs, religion and values, customs and rituals, art and language, clothing and food patterns, and lifestyles depicted in these films. As a result, it becomes evident that early documentary filmmakers emphasized portraying contemporary society, culture, village life, and natural beauty. These filmmakers prioritized showcasing the cultural characteristics of rural people and used documentary films to explain the gradual development of social characteristics. Through art influenced by religion and the representation of Sri Lankan culture through clothing and local lifestyles, these documentaries aimed to quantitatively present the local identity and capture the contemporary social nature of the time.

**Keywords:** Cultural identity, Documentary film, Filmmaker, Indigenous identity, Social identity

[1] Development Officer, Department of Census and Statistics, Ministry of Economic Policies and Plan Implementation, Sri Lanka

Email:deepthikaabeysinghe@gmail.com https://orcid.org/0009-0002-8761-0807

Accepted the revised version: 01 December 2023. This work is licensed under C BY-SA 4.0. To view a copy of this license, visit http://creativecommons.org/licenses/by-sa/4.0/

# මුල් කාලීන දේශීය වාර්තා චිත්‍රපටවල අන්තර්ගත සමාජ සංස්කෘතික සංලක්ෂණ (තෝරාගත් වාර්තා චිත්‍රපට ත්‍රිත්වයක් ඇසුරෙන් කෙරෙන අධ්‍යයනයකි)


## සාරසංක්ෂේපය

වාර්තා චිත්‍රපටය මගින් පවත්නා දෑ යථාර්ථවාදීව ඉදිරිපත් කරනු ලබයි. එමගින් සමකාලීන සමාජය, සමකාලීන සංස්කෘතිය, ජන ජීවිතය, ස්වභාවික පරිසරය හා දේශීය අනන්‍යතා මූර්තිමත් කරයි. දේශීය වාර්තා චිත්‍රපටකරණයේ ආරම්භය ලෙස සැලකෙන්නේ වර්ෂ 1935 දී නිර්මාණය කළ ලංකා ගීතය (Song of Ceylon) චිත්‍රපටය යි. මුල් කාලීන වාර්තා චිත්‍රපටවල සමාජ සංස්කෘතික සංලක්ෂණ අන්තර්ගතව ඇත් ද යන්න මෙහි දී අධ්‍යයනයට ලක් කෙරුණි. සමාජ හා සංස්කෘතික සංලක්ෂණ මූර්තිමත් කිරීමෙහි ලා වාර්තා චිත්‍රපටයෙන් සිදුවූ දායකත්වය කවරාකාර ද යන්න විමසා බැලීම මෙහි අරමුණයි. එහි දී ලංකා ගීතය (Song of Ceylon), කඳුරට අගනුවර (Hill Capital) සහ නෙළුම්ගම (Nelumgama) යන තෝරාගත් වාර්තා චිත්‍රපට ත්‍රිත්වයේ සමාජ රටාවන් හා ක්‍රමවේද ලෙස හඳුනාගත් සමාජ සංලක්ෂණත්, මිනිසාගේත් සමාජයේත් විවිධ හැසිරීම්, ප්‍රතිපදා සහ පිළිගැනීම් ලෙස හඳුනාගත් සංස්කෘතික සංලක්ෂණත්, මෙකී චිත්‍රපට ත්‍රිත්වයේ අන්තර්ගත වන්නේ කවරාකාරයෙන් ද යන්න අන්තර්ගත විෂය විශ්ලේෂණයට පාත්‍ර කොට ඇත. සමාජ රටාවන් හා ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනයේ දී ආරම්භක වාර්තා චිත්‍රපටවල ජීවනෝපාය, අධ්‍යාපනය, ප්‍රවාහනය, සන්නිවේදනය හා විනෝදාස්වාද සහ දේශපාලනය හා පරිපාලන ක්‍රමය යන ක්ෂේත්‍ර නියෝජනය වී ඇත්තේ කෙසේ ද යන්න සලකා බලා ඇත. එසේ ම සංස්කෘතික සංලක්ෂණ පිළිබඳ විමසීමේ දී ඇදහිලි හා විශ්වාස, ආගම හා සාරධර්ම, චාරිත්‍ර හා වාරිත්‍ර, කලාව හා භාෂාව, ඇඳුම් පැළඳුම් හා ආහාර රටා සහ ජීවන රටා මෙකී චිත්‍රපටවල නිරූපණය වී ඇත්තේ කෙසේ ද යන්න විමසුමට බඳුන් කර ඇත. ඒ අනුව මුල් කාලීන වාර්තා චිත්‍රපට තුළ සමකාලීන සමාජය, සංස්කෘතිය, ගැමි ජීවිතය සහ ස්වභාව සෞන්දර්යය ප්‍රතිනිර්මාණයෙහි ලා නිර්මාණකරුවා පුළුල් අවධානයක් යොමු කර ඇති ආකාරය හඳුනාගත හැකි ය. එහි දී සිනමාකරුවා ගැමි ජනයා සතුව පැවති සංස්කෘතික ලක්ෂණ විද්‍යමාන කිරීමෙහි ලා ප්‍රමුඛත්වයක් ලබා දී ඇති අතර, ක්‍රමිකව විධිමත්ව සංවර්ධනය වූ සමාජ ලක්ෂණ විශද කිරීමට ද වාර්තා චිත්‍රපටය යොදාගෙන ඇත. ආගම මගින් පෝෂණය වූ කලාවත්, දේශීයත්වය ඉස්මතු වූ ඇඳුම් පැළඳුම් හා ජීවන රටා මගින් ලාංකේය සංස්කෘතියත්, දේශීය අනන්‍යතාවත් ප්‍රමාණාත්මක ලෙස විද්‍යමාන කිරීමට සිනමාකරුවා ගෙන ඇති උත්සාහය තුළ සමකාලීන සමාජ ස්වභාවයත්, සංස්කෘතියක් ත ත්ත්වාකාරයෙන් හඳුනාගත හැකි ය.


**ප්‍රමුඛ පද:** දේශීය අනන්‍යතාව, වාර්තා චිත්‍රපටය, සමාජ සංලක්ෂණ, සංස්කෘතික සංලක්ෂණ, සිනමාකරුවා

## හැඳින්වීම

සැබෑ ලෝකය මෙන්ම මානව හා සමාජ ක්‍රියාකාරකම් පදනම් කොටගත් චිත්‍රපට ප්‍රවර්ගයක්වන වාර්තා චිත්‍රපටය මගින් පවත්නා දෑ යථාර්ථවාදීව ඉදිරිපත් කරනු ලබයි. එමගින් සමකාලීන සමාජය, සමකාලීන සංස්කෘතිය, ජන ජීවිතය, ස්වභාවික පරිසරය හා දේශීය අනන්‍යතා මූර්තිමත් කරයි. දේශීය වාර්තා චිත්‍රපටකරණයේ ආරම්භය ලෙස සැලකෙන්නේ වර්ෂ 1935 දී නිර්මාණය කළ ලංකා ගීතය (Song of Ceylon) චිත්‍රපටය යි. ලාංකේය වාර්තා චිත්‍රපටකරණයේ සංධිස්ථානයක් සටහන් කළ එම චිත්‍රපටය, පසුකාලීනව විවිධ දිශානතීන් පදනම් කොටගත් වාර්තා චිත්‍රපට රැසක් බිහිකිරීමෙහි ලා පූර්වාදර්ශ සැපයීය. ඒ අනුව මෙහි දී දේශීය වාර්තා චිත්‍රපටකරණයේ මුල්කාලීන නිර්මාණ අතරින් ලංකා ගීතය (Song of Ceylon), කඳුරට අගනුවර (Hill Capital) සහ නෙළුම්ගම (Nelumgama) යන වාර්තා චිත්‍රපට ත්‍රිත්වයේ සමාජ සංස්කෘතික සන්නිවේදන ලක්ෂණ විමර්ශනයට පාත්‍ර කෙරේ. තත්කාලීන සමාජය සහ සංස්කෘතිය මෙම නිර්මාණ තුළ වරනැගී ඇත්තේ කෙසේ ද යන්න අන්තර්ගත විශ්ලේෂණය මගින් කරුණු අධ්‍යයනය කෙරේ. එනයින් සමකාලීන සමාජ සංස්කෘතික ලක්ෂණ මූර්තිමත් කිරීමෙහි ලා වාර්තා චිත්‍රපටයේ කාර්යභාර්ය කවරාකාර ද යන්න මෙම ලිපිය මගින් විමසුමට බඳුන් කෙරේ.

**සාකච්ඡාව**

වාර්තා චිත්‍රපටය හෙවත් යන Documentary පදය මුලින් ම භාවිතයට ගන්නේ ජෝන් ග්‍රියර්සන් විසිනි. රොබට් ෆ්ලැහර්ටි විසින් නිර්මාණය කළ මොආනා (Moana – 1926) චිත්‍රපටය හැඳින්වීම සඳහා ඔහු මෙම පදය භාවිත කර තිබුණි. "Documentary යන යෙදුම ප්‍රංශ භාෂාවේ Documentaire යන වචනයෙන් බිඳී ආවකි. Travel Film, Travelogue යන චිත්‍රපට විශේෂය හැඳින්වීම සඳහා ප්‍රංශ භාෂාවේ එම යෙදුම භාවිත වේ" (ද සිල්වා, 2012, පි. 269).

වාර්තා චිත්‍රපටය තුළ යථාව යථාර්ථවාදීව ප්‍රතිනිර්මාණය කරනු ලැබේ. එය වාර්තා චිත්‍රපටයට අනන්‍ය වූ සුවිශේෂ ම ලක්ෂණය යි. වාර්තාකථන ස්වරූපයත්, යථාර්ථවාදී ශෛලියත් නිසා මෙම චිත්‍රපට ප්‍රවර්ගය වෘතාන්ත සිනමා ධාරාවෙන් වෙනස් වන අතර එයින් අපේක්ෂිත අරමුණු ද වඩා විධිමත් සහ නිශ්චිත වේ. ඒ අනුව සිනමාව සම්බන්ධ විෂය ප්‍රාමාණිකයන්, විචාරකයන් වාර්තා චිත්‍රපටය යනු කුමක් ද යන්න විග්‍රහ කිරීමට දැරූ ප්‍රයත්නය තුළ එහි කාර්යභාර්ය හා ස්වරූපය කෙසේ ද යන්න විමසා බැලිය හැකි ය. වාර්තා සිනමාව යථාර්ථයේ ප්‍රතිනිර්මාණයක් ලෙස හඳුන්වා දෙන ජෝන් ග්‍රියර්සන් යම් සිදුවීමක් දෘශ්‍ය මාධ්‍ය භාවිත කරමින් යථාර්ථවාදීව ඉදිරිපත් කිරීමට වාර්තා චිත්‍රපටයේ ඇති ශක්‍යතාව පැහැදිලි කරයි.

පෝල් වෙල්ස් නම් සිනමා විචාරකයා දක්වන ආකාරයට "වාර්තා චිත්‍රපටය යනු යථාර්ථය වාර්තා කිරීම යන අරුතින් නොව, යථාර්ථය නිරූපණය කිරීමේ තවත් එක් විධික්‍රමයක් ලෙස හඳුනාගත යුතු ය (ද සිල්වා, 2012, පි. 271).

ඇන්ඩෲ බ්‍රිටන් දක්වන ආකාරයට "පළමු ව (උසස්) වාර්තා සිනමා කෘතින් විශ්ලේෂණාත්මක ය. ඒවායින් නිරූපණය වන්නේ යථාර්ථයේ අන්තය යි. (The Corner of reality) වාර්තා චිත්‍රපටකරුවා ගනුදෙනු කරන්නේ යම් අවස්ථාවක සැබෑ ලෙස දකන්නට ඇති දේ සමග නොව, චිත්‍රපටයට පසුබිම් වන සංසිද්ධි සියල්ල නිර්මාණය වන බලවේග හා ක්‍රියාදාමය වශයෙන් වූ, විවිධ සංදර්භ ඇසුරින් වටහා ගත යුතු සමාජ හා ඓතිහාසික යථාර්ථය සමග ය. දෙවනුව වාර්තා චිත්‍රපටය ඊට අදාළ සියල්ල සමග අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතියි. නැතහොත් ඊට අනුගත වෙයි. වාර්තා චිත්‍රපටය හුදු විෂය මූලික වූවක් නොවේ. යම් කරුණක් උදෙසා ක්‍රියාකාරී ලෙස දායක වීමෙන් කිසියම් මතයක්/ දෘෂ්ටියක් එක්තරා ආකෘතියකට අනුකූලව සැලසුම් කර ඉදිරිපත් කරයි (ද සිල්වා, 2012, පි. 271).

1948 වාර්තා චිත්‍රපට පිළිබඳ ලෝක සංගමය (The World Union of Documentary) විසින් ඉදිරිපත් කර ඇති නිර්වචනය අනුව "යම් කරුණක් උදෙසා (ප්‍රේක්ෂකයා) පොළඹවාලීමේ සහ දැනුම හා අවබෝධය පුළුල් කිරීමේ අරමුණෙන් ද, සත්‍ය වශයෙන් ම පවත්නා යම් ගැටලුවක් අනාවරණය කොට ඊට විසඳුම් ලබාදීමේ අරමුණෙන් ද තථ්‍ය ලෙස රූගත කර ඉදිරිපත් කිරීමෙන් හෝ හෘදයංගම හා යුක්ති සහගත ලෙස එවැන්නක් (යථාර්ථය) නැවත ගොඩනැංවීමෙන් ද යථාර්ථයේ පවත්නා යම්කිසි කරුණක්, සිදුවීමක් අළලා නිර්මිත ව්‍යාඛ්‍යානය වාර්තා චිත්‍රපටය යි (ද සිල්වා, 2012, පි. 271).

සිනමා විචාරකයන් හා ප්‍රාමාණිකයන් වාර්තා චිත්‍රපටය යනු කුමක් ද යන්නත් එහි අරමුණු කවරාකාර ද යන්නත් එහි කාර්යය කෙබඳු ද යන්නත් පැහැදිලි කිරීමට උත්සාහ දරා ඇති ආකාරය ඉහත නිර්වචන මගින් හඳුනාගත හැකි ය. සැබෑව තත්ත්වාකාරයෙන් ප්‍රතිනිර්මාණය කරමින් ප්‍රේක්ෂකයාට සැබෑ ස්වරූපය ඉදිරිපත් කිරීම වාර්තා චිත්‍රපට ප්‍රවර්ගය තුළින් සිදු කෙරෙන බව පැහැදිලි වේ. 1925 රොබට් ෆ්ලැහර්ටි (Robert Flaherty) විසින් නිර්මාණය කරන ලද මොආනා (Moana – 1926) චිත්‍රපටය වාර්තා චිත්‍රපටකරණයේ ආරම්භය ලෙස සැලකේ. ජෝන් ග්‍රියර්සන් විසින් මෙම චිත්‍රපටය හැඳින්වීම සඳහා වාර්තා චිත්‍රපටය හෙවත් Documentary Film යන පදය භාවිතයට ගැනීම චිත්‍රපටයේ වෙනස් දිශානතියක ආරම්භක සංඥාව වෙයි. ඉන් අනතුරුව වාර්තා චිත්‍රපටය ක්‍රමානුකූලව වර්ධනය වෙමින් විවිධ මානයන් ඔස්සේ විකාසනය වී ඇත.

බර්ට්‍රම් නිහාල් විසින් රචිත සිය සිනාරියෝ වාර්තා චිත්‍රපටකරණය නම් ග්‍රන්ථයේ වාර්තා චිත්‍රපටයේ ප්‍රභේද 07ක් හඳුන්වා දී තිබේ.

01. තොරතුරු චිත්‍රපට (Factual Film)
02. මානව විද්‍යාත්මක චිත්‍රපට (Ethnographic Film)
03. ගවේෂණාත්මක චිත්‍රපට (Film of Exploration)
04. ප්‍රචාරාත්මක චිත්‍රපට (Propaganda Films)

05. සැබෑ තතු චිත්‍රපට (Cinema Verite)
06. ඍජු සිනමාව (Direct Cinema)
07. වාර්තා (Documentary)

(නිහාල්, 2014, පි. 5)

"වාර්තා චිත්‍රපටය විවිධ විෂයන් තේමා කර ගන්නවා. සමාජ විද්‍යා, ආර්ථික විද්‍යා, මානව විද්‍යා, භූ විෂමතා මෙන්ම මිනිසුන්ගේ ආකල්ප ආදී වූ විෂයයන් තේමා කරගනිමින් වාර්තා චිත්‍රපටය ප්‍රයත්න දරන්නේ මිනිසා දැනුම්වත් කිරීමට යි. මේ දැනුම්වත් කිරීමේ අරමුණ තුළ පවතිමින් තවත් බොහෝ ඉලක්ක කරා යොමුවීමට වාර්තා චිත්‍රපටකරුවා ප්‍රයත්න දරනවා (වේරගම, 2000, පි. 45).

ආකෘතික හා අන්තර්ගතික වශයෙන් විවිධ මානයන් හඹා ගිය වාර්තා චිත්‍රපටය, භූගෝලීය සීමා අතික්‍රමණය කරමින් වෘතාන්ත සිනමාව මෙන් ම ශීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. ඒ අනුව දේශීය වාර්තා චිත්‍රපටයේ උපත බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලන සමය දක්වා දිවයයි. බ්‍රිතාන්‍ය පාලන සමයේ අධිරාජ්‍යවාදී පාලකයන් දේශීයත්වය විදේශයනට ගෙන යාම සඳහා භාවිත කළ ප්‍රධාන මාධ්‍යයක් වූයේ වාර්තා චිත්‍රපටය යි. 1935 ජෝන් ග්‍රියර්සන් නිර්මාණය කළ ලංකා ගීතය (Song of Ceylon) දේශීය වාර්තා චිත්‍රපටකරණයේ ආරම්භය ලෙස සැලකේ.

"ලාංකේය පිළිබිඹුව විදේශයනට ගමන් කළ තවත් වැදගත් ක්‍රමවේදයක් වන්නේ වාර්තා චිත්‍රපටකරණය යි. මෙරට වාර්තා සිනමා කලාවේ ආරම්භය විධිමත් ලෙස සලකුණු වන්නේ, තේ අලෙවිය පිණිස ප්‍රචාරය ලබා ගැනීමේ උපක්‍රමයක් වශයෙන් 1935 දී ලංකා ගීතය (Song of Ceylon) නිපදවීමත් සමග ය" (ගුණසේකර, 2021, පි. 129).

මෙම චිත්‍රපටයට පෙර වාර්තා චිත්‍රපට ලෙස අවධානය යොමු වූ නිර්මාණ ද්විත්වයක් පිළිබඳ සඳහන් වුවත් දේශීය වාර්තා සිනමාවේ ආරම්භය ලෙස සලකන්නේ 1935 ලංකා ගීතය (Song of Ceylon) නිර්මාණය වීම යි. "එහෙත් ලංකාවේ ප්‍රතිබිම්බ, වාර්තා චිත්‍රපට ලෙසින් ඊට පෙර අවස්ථා දෙකක දී විදේශිකයන්ගේ අවධානට පාත්‍ර වී ඇත. A Ramble Through Ceylon නම් 1904 දී රූපගත කළ චිත්‍රපටයක් ගැනත් Curious Scences in India නමින් ලංකාවේ දර්ශන ඇතුළත්ව 1912 දී නිම වූ චිත්‍රපටයත් ගැනත් වොෂිංටන් කොංග්‍රස් පුස්තකතාලයේ චිත්‍රපට සංරක්ෂණාගාර තොරතුරුවලින් කරුණු හෙළි වී ඇත " (ගුණසේකර, 2021, පි. 130).

මෙසේ ඇරඹුණු දේශීය වාර්තා චිත්‍රපට කලාව ලාංකේය අනන්‍යතා, උරුමකම්, ජීවන රටා සහ ජෛව විවිධත්වය විදේශිකයන් වෙත රැගෙන ගිය ප්‍රධානම ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදන ක්‍රමවේදය විය. ඒ අනුව මෙරට වාර්තා චිත්‍රපට මගින් ප්‍රතිමූර්තිමත් වූ විෂය පරාස කිහිපයක් හඳුනාගත හැකි ය.

01. ලංකාවේ පුරාවිද්‍යාත්මක වටිනාකම
02. සමකාලීන සංස්කෘතිය
03. සමකාලීන ගැමි ජීවිතය
04. සමකාලීන ස්වභාව සෞන්දර්යය

වාර්තා චිත්‍රපටකරුවෝ මෙකී දිශානතින් ඔස්සේ ලංකාවේ විවිධ පැතිකඩ ග්‍රහණය කර ගනිමින් විවිධ අරමුණු අරබයා නිර්මාණය කළ වාර්තා චිත්‍රපට රාශියක් හඳුනාගත හැකි ය. ජුලියෝ පෙට්රෝනි නිර්මාණය කළ Air Ceylon New Wings, New Horizone, Hill Capital යන වාර්තා චිත්‍රපටත්, ෆෙඩ්රිකෝ සේරා අධ්‍යක්ෂණය කළ Royal Mail චිත්‍රපටයත් ඔහුගේ Census සහ Nursing Today යන චිත්‍රපටයත් ආරම්භක වාර්තා චිත්‍රපට අතර වැදගත් වේ. එසේ ම දේශීයත්වය ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා වාර්තා චිත්‍රපට මාධ්‍ය භාවිත කළ නිර්මාණකරුවන් අතර රැල්ෆ් කීන් ද විශේෂ ය. ඔහුගේ Heritage of Lanka සහ Nelumgama යන වාර්තා චිත්‍රපට දේශීය අනන්‍යතා පිළිබිඹු කිරීමෙහි ලා සුවිශේෂ නිර්මාණ වේ.

බ්‍රිතාන්‍ය සිනමාකරුවන්ගෙන් ඔබ්බට යමින් දේශීය වාර්තා චිත්‍රපට කලාව තුළ ලාංකේය නිර්මාණකරුවන්ගේ දායකත්වය ද හඳුනාගත හැකි ය. එහි දී ලෙස්ටර් ජේම්ස් පීරිස්, ජෝර්ජ් වික්‍රමසිංහ, ප්‍රඥාසෝම හෙට්ටිආරච්චි, අර්වින් දසනායක, විල්ෆ්‍රඩ් පෙරේරා සහ තිස්ස ලියනසූරිය යනු වාර්තා චිත්‍රපටය මගින් දේශීය මානයන් සොයා ගිය සිනමාකරුවන් ලෙස සැලකිය හැකි ය. මොවුන් දේශීය

ජන සමාජයේ විවිධ තේමා වාර්තා චිත්‍රපටය සඳහා නිමිති කර ගනිමින් නිර්මාණකරණයේ යෙදී ඇති ආකාරය දක්නට ලැබේ.

ලෙස්ටර් ජේම්ස් පීරිස් විසින් චිත්‍රපට අංශය වෙනුවෙන් නිර්මාණය කළ චිත්‍රපට අතරින් වඩා වැදගත් වන්නේ වියළි කලාපය ජයගනී (Conquest in the Day Zone) ය. උතුරු මැද පළාතේ මැලේරියා රෝගය මර්දනය කිරීමට ගත් ව්‍යායාමය මෙහි විෂය වෙයි (රත්නවිභූෂණ, 2012, පි. 22).

ප්‍රඥාසෝම හෙට්ටිආරච්චිගේ චිත්‍රපට අතරින් ලංකා තේ ශත සංවත්සරය (Century of Ceylon Tea) වැදගත් තැනක් උසුලයි. යූ. බී. ඇල්කඩුව වර්ණයෙන් ඡායාරූපගත කළ මෙම චිත්‍රපටය මගින් ලංකාවේ තේ කර්මාන්තයේ ආරම්භයත්, එහි ව්‍යාප්තියත්, පසුව එය මෙරට ප්‍රධාන අපනයන ද්‍රව්‍ය බවට පත් වූ ආකාරයත් ඉතාමත් ව්‍යක්තව සිනමාවට හසු කර ගනී (රත්නවිභූෂණ, 2012, පි. 131).

දේශීය සමාජ සංස්කෘතික ලක්ෂණ ග්‍රහණය කර ගත් වාර්තා චිත්‍රපට කලාව තුළ සුවිශේෂී සංධිස්ථාන සටහන් කරමින් දේශීය අනන්‍යතාව ජාත්‍යන්තරය වෙත රැගෙන ගිය නිර්මාණ අතරින් 1935 ජෝන් ග්‍රියර්සන් නිර්මාණය කළ ලංකා ගීතය (Song of Ceylon) චිත්‍රපටයත්, ජූලියෝ පෙට්රෝනි 1950 වසරේ අධ්‍යක්ෂණය කළ කඳුරට අගනුවර (Hill Capital) චිත්‍රපටයත්, 1953 වසරේ රැල්ෆ් කීන් නිර්මාණය කළ නෙළුම්ගම චිත්‍රපටයත් යන නිර්මාණ ත්‍රිත්වයෙහි දේශීය සමාජ සංස්කෘතික ලක්ෂණ විද්‍යමානව ඇත්තේ කවරාකාරයෙන් ද යන්න මෙහි දී අධ්‍යයනයට පාත්‍ර කෙරේ.

සමාජ සංස්කෘතික සංලක්ෂණ මොනවා ද යන්න විග්‍රහ කිරීමට ප්‍රථම සමාජය හා සංස්කෘතිය හඳුනාගැනීම වැදගත් ය. සමාජ හා මානව විද්‍යාඥයන් සමාජය යන්න විවිධ ස්වරූපයෙන් විග්‍රහ කිරීමට උත්සාහ ගෙන ඇත. මිනිසුන්ගේ ජීවන පැවැත්ම රඳා පවතින්නේ මෙම භූගෝලීය පරිසරය හෝ වටපිටාව අනුව ය. ප්‍රජනනය (Reproduction) හෙවත් උත්පාදනමය හැකියාව ද සමාජයක ස්ථිරභාවය කෙරෙහි බලපායි. මිනිසුන් නොමැතිව සමාජයක් ගැන අපට කථා කළ නොහැකි ය. මේ හේතුව නිසා ජනගහනය ඇති වීම වැදගත් දෙයකි. ජනගහනය සමාජයේ අත්‍යවශ්‍යම දෙයකි. ජනගහනය සමාජයේ අත්‍යවශ්‍යම සංයුතිය යි. එමෙන්ම සමාජයක් පවත්වාගෙන යාමේ තවත් අවශ්‍යම සංකල්පයක් ලෙස සමාජ හා මානව විද්‍යාඥයන් පෙන්වා දී ඇත්තේ පොදු හා පුළුල් සංස්කෘතිය යි. මෙසේ සමාජය යනුවෙන් අප හඳුන්වන සංකල්පය සකස් වීමේ දී පහත සඳහන් පොදු කරුණු හතර ප්‍රධාන වෙයි.

1. දේශපාලනය හා මානව නිදහස (Political and Human Independence)
2. භූගෝලීය අවකාශය (Geographical Space)
3. ප්‍රජනනය හෙවත් උත්පාදනය (Reproduction)
4. පොදු සංස්කෘතිය (Compreheìive Culture)

(පෙරේරා, 2021, පි. 53-54)

සමාජය නම් සංස්ථාව බිහිවීමෙහි ලා මූලික වන අංග මොනවා ද යන්න මෙම පාඨය තුළ විශද කොට ඇත. සමාජයේ පැවැත්ම සඳහාත් පරිණාමය සඳහාත් එකී සාධක බලපැවැත්වෙන්නේ කෙසේ ද යන්නත් සමාජ ජීවීන් වන මිනිසා සමාජ සංස්ථාව තුළ පොදු සංස්කෘතිය නම් සාධකය මගින් හසුරනව බවත් එහි දී හඳුනාගත හැකි ය. සමාජය යන්නෙන් අදහස් කරන්නේ පුද්ගල එකතුවකි. එය කිසියම් ප්‍රදේශයක පොදු සංස්කෘතියක් බෙදා හදා ගන්නා මිනිසුන් පිරිසක් ජීවත් වන ස්ථානයක් වන අතර, සමාජය සමන්විත වන්නේ එකිනෙකා හා සම්බන්ධ වූ සමාජ ආයතනවලිනි. සමාජයක් නැති මනුෂ්‍ය ජීවිතයක් ගැන සිතිය නොහැකි ය. මිනිසුන්ගේ එකතුවක් වන සමාජය ඒ ඒ සමාජය විසින් පිළිගත් ධර්මතා, ඇගයීම්, විශ්වාස, ආචාර ධර්ම, පිළිගැනීම්, සම්ප්‍රදායන්, සිරිත් විරිත්, සට්ටනයන් හා නීති රීතිවලට අනුකූලව සංවිධානය වී පවතී (පෙරේරා, 2023, පි. 22).

සමාජය හා සංස්කෘතිය යනු එකට බැඳී පවතින්නකි. සමාජය නැමැති පොදු කුලකය තුළ විවිධ සංස්කෘතීන්ට අයත් ජාතීන්, ආගම්, චාරිත්‍ර විධි ක්‍රම, ආචාර ධර්ම දක්නට ලැබේ. මෙම එක් එක් සංස්කෘතීන් තුළ පවත්නා ගතිකත්වය සමාජය නම් ඒකකයේ පැවැත්ම සඳහාත්, විවිධත්වය සඳහාත් බලපායි. සමාජය හා සංස්කෘතිය යන අංග ද්විත්වය ම නිරන්තරයෙන් යාවත්කාලීන වෙමින් ගමන් ගන්නා ප්‍රපංච වේ. සමාජය යන සංකල්පය මිනිසුන් හා සම්බන්ධව කතා කරන විට අපට පැහැදිලි වන්නේ සමාජය පුද්ගලයන් අතර පවතින්නක් බව ය. පුද්ගලයන් හෝ මිනිස් කණ්ඩායම් අතර ඔවුනොවුන් එකිනෙකා හා සම්බන්ධ කරනු ලබන කිසියම් ක්‍රමවත් වූ ආකාරයකට සංවිධානය වූ

මෝස්තරයක් එම පුද්ගලයන් හෝ මිනිස් කණ්ඩායම් පිළිබඳව පරීක්ෂාකාරීව බලන විට පැහැදිලිව දක්නට ලැබේ (පල්ලියගුරු, 2000, පි. 22).

ඉහත අදහස්වලට අනුව සමාජය යනු කුමක් ද යන්නත් කුඩාම සමාජ ඒකකය ලෙස ගැනෙන පවුල තුළ මිනිසාගේ හැසිරීමත්, පවුල් ඒකක ඒකරාශී වීමෙන් බිහිවෙන සමාජය තුළ ගතිකත්වයක් සහිත මිනිසුන්ගේ බහුවිධ චර්යා රටාවන් හඳුනාගත හැකි ය. ඒ අනුව සමස්තයක් ලෙස ගත් කල මිනිසාගේ අවශ්‍යතා හා වුවමනා තෘප්ත කරනු වස් සමාජය තුළ ක්‍රියාත්මක වන සමාජ රටාවන් හා ක්‍රමවේද ආරම්භක වාර්තා චිත්‍රපටවල අන්තර්ගතව ඇත්තේ කෙසේ ද යන්න තෝරා ගත් චිත්‍රපට ඇසුරෙන් පහත සඳහන් පරිදි වෙන් වෙන් වශයෙන් සලකා බැලීම සිදු කෙරේ.

01. ජීවනෝපාය
02. අධ්‍යාපනය
03. ප්‍රවාහනය
04. සන්නිවේදනය හා විනෝදාස්වාද
05. දේශපාලනය හා පරිපාලන ක්‍රමය
06. සෞඛ්‍ය

සංස්කෘතික සංලක්ෂණ පිළිබඳ විමසීමට පෙර සංස්කෘතිය හඳුනාගැනීම වැදගත් ය. සංස්කෘතිය යනු කුමක් දැයි විග්‍රහ කිරීම අතිශය අසීරු කාර්යයක් වේ. සංස්කෘතිය තුළ පවත්නා නිරන්තර ගතිකත්වය එයට හේතුව යි. ඇල්ෆ්‍රඩ් කෝබර් (Alfred Kroeber) නම් මානව විද්‍යාඥයා සඳහන් කරන ආකාරයට සංස්කෘතිය පිළිබඳ ඉදිරිපත් කොට ඇති නිර්වචන සංඛ්‍යාව 180 කට අධික වීම තුළ එහි සංකීර්ණත්වය හා ගතිකත්වය පැහැදිලි වේ. ඉංග්‍රිසි භාෂාවේ Culture යන පදයෙන් සංස්කෘතිය යන පදය විග්‍රහ කර ඇත. 1871 ඊ. බී. ටයිලර් (E.B. Tylor) විසින් ඉංග්‍රිසි භාෂාවට මෙම පදය ඔහුගේ ආදි කල්පික සංස්කෘතිය නම් ග්‍රන්ථයේ දී හඳුන්වා දී ඇත්තේ මෙසේ ය.

> "පුද්ගලයා සමාජයේ සාමාජිකයෙකු වශයෙන් ලබාගන්නා දැනුම, විශ්වාස, සාරධර්ම, නීතිය, සිරිත් විරිත් හා වෙනත් හැදියාවන් මෙන් ම පුරුදු ආදි දෙයෙහි එකමිතිය සංස්කෘතිය යනුයෙන් නම් ලැබීමට සුදුසු විෂය පරාසයක් වෙයි " (කුමරපේලි, 2007, පි. 55).

ඊ.බී. ටයිලර් (E.B. Tylor) නම් මානව විද්‍යාඥයා දක්වන ආකාරයට සංස්කෘතිය යනු සමාජ සත්වයෙකු ලෙස මිනිසා අත්පත් කර ගත් විශ්වාස, ඇදහිලි, කලා ශිල්ප, හැසිරීම්, නීති, දැනුම ඇතුළත් සංකීර්ණ සමස්තය යි. එමෙන්ම සංස්කෘතිය භෞතික හා අභෞතික ලෙස මූලිකව කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි ය. මේ අනුව මිනිසා විසින් සිදු කරනු ලබන ඉදිකිරීම්, ජීවනෝපාය ක්‍රම මෙන්ම ඇඳුම් පැළඳුම් ආදිය භෞතික සංස්කෘතිය යටතට ගැනෙන අතර ආගමික විශ්වාස, ඇදහිලි, චාරිත්‍ර වාරිත්‍ර, කලා ශිල්ප ආදිය අභෞතික සංස්කෘතිය ලෙස හැඳින්වෙයි (ගුණරත්න, 2014, පි. 136).

සංස්කෘතිය යනු කුමක් ද යන්න ඉහත දක්වන ලද අර්ථකථන තුළ සංස්කෘතියට අයත් අංශ මොනවාද යන්න මනාව විශද කොට ඇත. ඒ අනුව සංස්කෘතිය යනු කාලීනව විවිධ ප්‍රවණතා සමග ප්‍රතිබද්ධව යාවත්කාලීන වෙමින් ඉදිරියට පැවත යන මිනිසාගේත්, සමාජයේත් විවිධ හැසිරීම්, ප්‍රතිපදා සහ පිළිගැනීම් ය. ඒ අනුව මෙහි දී තෝරා ගත් චිත්‍රපට ත්‍රිත්වයේ සංස්කෘතික සංලක්ෂණ පහත අංශ ඔස්සේ වෙන් වෙන් වශයෙන් විමසුමට බඳුන් කෙරේ.

01. ඇදහිලි හා විශ්වාස
02. ආගම හා සාරධර්ම
03. චාරිත්‍ර හා වාරිත්‍ර
04. කලාව හා භාෂාව
05. ඇඳුම් පැළඳුම් හා ආහාර රටා
06. ජීවන රටා

*ලංකා ගීතය (Song of Ceylon) - 1935*

කලු සුදු - මි.මි 35
ධාවන කාලය - මිනිත්තු 41
නිෂ්පාදක - ජෝන් ග්‍රියර්සන්

අධ්‍යක්ෂ, සංස්කාරක හා කැමරා ශිල්පී - බැසිල් රයිට්
සහය අධ්‍යක්ෂ - ජෝන් ටේලර්
සංගීතය - වෝල්ටර් ලී
පිටපත සහ කථනය - ලයනල් වෙන්ඩ්ට්
පටිගත කිරීම - ඊ.ඒ. පව්ලි

වාර්තා චිත්‍රපට කලාවේ පුරෝගාමියෙකු වූ ජෝන් ග්‍රියර්සන් නිෂ්පාදනය කළ එක්තරා වාර්තා චිත්‍රපටයක් ශ්‍රී ලංකාව පිළිබඳ කියැවෙන්නකි. ඒ චිත්‍රපටය නම් ලංකා ගීතය යි. (Song of Ceylon - 1934) ලංකා ගීතය ලෝකයේ මෙතෙක් බිහිවූ විශිෂ්ටතම වාර්තා චිත්‍රපටයක් ලෙස විචාරකයන් විසින් සලකනු ලබයි. ප්‍රවීණ සිනමා විචාරකයෙකු වන ආචාර්ය රෝජර් මැන්වෙල් ලංකා ගීතය හඳුන්වා ඇත්තේ බ්‍රිතාන්‍යයන් විසින් එතෙක් නිෂ්පාදනය කරන ලද කවර හෝ ආකාරයේ චිත්‍රපට අතරින් ඉතාම උසස් නිර්මාණය වශයෙනි (ජයමාන්න, 2000, පි. 47).

චිත්‍රපටය The Buddha, The Virgin Island, The Voices of Commerce, The Appeal of a God ලෙස ප්‍රධාන පරිච්ඡේද 04ක් ඔස්සේ ඉදිරිපත් කර ඇත. " විනාඩි 40ක ධාවන කාලයකින් යුතු ලංකා ගීතය කොටස් හතරකින් සමන්විත ය. පළමුවැනි කොටස හැඳින්වෙන්නේ ද බුද්ධා (The Buddha) නමිනි. ද වර්ජින් අයිලන්ඩ් (The Virgin Island) එහි දෙවැන්න යි. තුන්වැන්න ද වොයිස් ඔෆ් කොමර්ස් ය. (The Voices of Commerce) ද ඇපරල් ඔෆ් ගෝඩ් (The Appeal of a God) මෙහි හතරවැන්න යි. මුල් කොටස ශ්‍රී පාද වන්දනාව අළලා සකස් වී ඇත. ඉන් සිංහලයන් හා බුදු දහම අතර පවත්නා සම්බන්ධය කියැවෙයි. මෙරට පාරම්පරික ගැමි ජීවන ක්‍රමය දෙවැනි කොටසින් නිරූපණය කෙරේ. තුන්වැනි කොටස වෙන් වන්නේ වාණිජත්වයේ ආක්‍රමණය සිදුවන ආකාරය පිළිබඳව ය. මේ කොටසේ දී එංගලන්තයේ කොමන් ගාර්ඩන් වෙන්දේසි පොළේ තේ වෙන්දේසිය පසුබිමින් ඇසේ. ඒ සඳහා යොදා ගෙන ඇත්තේ ජෝන් ග්‍රියර්සන්, ඇල්බර්ටෝ කැවලකන්ටි හා ස්ටුවර්ට් ලෙග් හා බැසිල් රයිට්ගේ කටහඬවල් බව පැවසේ. ආගමික අංශයෙන් ලංකාව දෙස බැලීමක් හතරවැනි කොටසින් සිදු කෙරේ (ජයමාන්න, 2000, පි. 47).

***සමාජ සංලක්ෂණ***

ලාංකේය සමාජ සංලක්ෂණ බහුලව කැටි කොටගත් නිර්මාණයක් ලෙස ලංකා ගීතය (Song of Ceylon) චිත්‍රපටය පෙන්වා දිය හැකි ය. එකල මිනිසුන් ජීවනෝපාය සඳහා නියැලි කර්මාන්ත කිහිපයක් ම මෙහි දී නිර්මාණකරුවා චිත්‍රපටය තුළ නිරූපණය කර ඇත. මසුන් මරන ධීවරයන් ග්‍රහණය කොටගත් රූප රාමු ධීවර කර්මාන්තයේ ස්වරූපයත්, කුඹල් කර්මාන්තය, රෙදි වෙල්ලාල කටයුතු සිදු කිරීමත් වී වගාව ප්‍රමුඛ කොටගත් කෘෂිකර්මාන්තයේ පැවැත්මත් එමගින් නිරූපිත ය. විශේෂයෙන්ම එකල අස්වනු නෙලීමේ ක්‍රියාවලිය සඳහා භාවිත කළ ක්‍රමවේද (සතුන් යොදා ගැනීම) පිළිබඳවත් එවැනි කාර්යයන් සඳහා ගැමි ජනතාව සාමූහිකව කටයුතු කළ ආකාරයත් හඳුනාගත හැකි ය. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් වතු වගාව ව්‍යාප්ත කිරීමත් සමග ඇරඹි තේ කර්මාන්තය විෂය කොටගන්නා නිර්මාණකරුවා තේ දලු නෙළන කාන්තාවන්, තේ කර්මාන්ත ශාලා සහ තේ අපනයනයට අදාළ කාර්යයන් වාර්තා චිත්‍රපටය ඔස්සේ විදේශයන් වෙත රැගෙන ගොස් ඇත. ලංකාවේ තේ සඳහා වෙළඳපොළමය වටිනාකමක් ඇති කිරීමට එමගින් උත්සාහ දරා ඇත.
මෙකල ගමනාගමනය සඳහා බහුල ලෙස කරත්ත හා ලොරි යොදාගෙන ඇත. විශේෂයෙන් ගම් ආශ්‍රිතව කරත්ත භාවිතය බහුල වූ අතර අගනගරය වෙත භාණ්ඩ ප්‍රවාහන ක්‍රියාවලිය සඳහා ලොරි යොදාගෙන තිබේ. තේ ඇතුළු විදේශ අපනයන ප්‍රවාහනය සඳහා නැව් යොදාගත් ආකාරය කොළඹ වරාය ආශ්‍රිත දර්ශන මගින් නිරූපණය කර ඇත. උඩරට සිට ගමන් ගන්නා දුම්රියක හඬ ඇසෙන දර්ශනය තුළින් ප්‍රවාහන ක්‍රම පිළිබඳ සන්නිවේදනය කර ඇත. උඩරට සිට කොළඹ දක්වා භාණ්ඩ ප්‍රවාහනය ඉලක්ක කොට ගෙන දුම්රිය මාර්ගය ගොඩනගන්නේ ද ඔවුන්ගේ වාණිජ අරමුණු මුදුන් පත් කර ගැනීමේ අරමුණෙනි. ලංකා ගීතය චිත්‍රපටයේ The Voices of Commerce යන තේමාව යටතේ එන මෙම දර්ශනයෙන් වාණිජමය අරමුණු උදෙසා ප්‍රවාහන පද්ධතිය ගොඩනගා ඇති බව පැහැදිලි වේ.

***සංස්කෘතික සංලක්ෂණ***

ලාංකේය ගැමි සමාජය තුළ පැවති ඇදහිලි විශ්වාස ග්‍රහණය කරගන්නා නිර්මාණකරුවා දේශීය ජන සමාජයේ ගැමියන් තුළ පවත්නා විශ්වාස ඉදිරිපත් කිරීමෙහි ලා ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇත. ලෙඩ රෝග සඳහා, ආරක්ෂාව සඳහා ගැමි සමාජයේ පැවති ඇදහිලි හා විශ්වාස අතර ශාන්ති කර්ම හෙවත් බලි තොවිල් සඳහා ගැමියන් ඉතා ගරු ගාම්භීරව කැප වන ආකාරය පෙන්නුම් කරමින් නොපෙනෙන

බලවේග මත තබන ලද විශ්වාසය ගැමි ජන ජීවිතයේ අනිවාර්ය ලක්ෂණයක් බව චිත්‍රපටයෙන් කියැවෙයි. දේශීය ජන සමාජයේ සංස්කෘතික ලක්ෂණ අතර ඇදහිලි හා විශ්වාස වෙත පැවති නැමියාවත්, මේවා විෂයෙහි ගැමියන්ගේ පැවති යටහත් පහත් ගති ස්වභාවයත්, නොපෙනෙන බලවේග මත තීන්දු තීරණ ගැනීමේ ලක්ෂණයත් සංස්කෘතියේ මූලිකාංගයක් ලෙස හුවා දක්වමින් චිත්‍රපටය ආරම්භය සඳහා ද ශාන්ති කර්මයක දර්ශනයක් යොදාගෙන ඇත.

ලංකා ගීතය චිත්‍රපටය තුළ එන දර්ශන අතර සැලකිය යුතු කාල පරාසයක් ගැමි ජනයාගේ ආගමික චර්යාවන් නිරූපණය සඳහා යොදාගෙන ඇත. සුදු වතින් සැරසී සිරිපා වන්දනාවේ යන බැතිමතුන් සමූහයක් ග්‍රහණය කර ගන්නා නිර්මාණකරුවා ආගම විෂයෙහි ගැමියන්ගේ පූජා ක්‍රම, ලැදියාවන් තත්වාකාරයෙන් නිරූපණය කර ඇත. බෞද්ධ ආගම විෂයෙහි ගැමියා තුළ පවත්නා පහන් ආකල්පයත්, දේශීය ගැමි ජනයාගේ ආගම සම්බන්ධව පවත්නා භක්ත්‍යාදරයත් නිරූපණය සඳහා චිත්‍රපටයේ එන රූපැරාමු පෙළ සාධනීය කර්තව්‍යයක් ඉටු කරනු පෙනේ.

ගැමි ජනයා තුළ පවත්නා භක්තිවන්තබව, සාමූහිකත්වය, සහජීවනය සහ අන්‍යෝන්‍ය බැඳියාව මනාව පිළිබිඹු කරන රූප රාමු පෙළ සිරිපා වන්දනාව යි.

සමකාලීන සමාජයේ සිංහල කුල කාන්තාව ඇඳි උඩරට ඔසරියත්, පුරුෂ පාර්ශවය සරම සහ බැනියම කය වසා ගැනීමට යොදාගෙන ඇති ආකාරයත් මෙහි දී දැකිය හැකි ය. විශේෂයෙන් එකල සමාජයේ පුරුෂ පාර්ශවයේ උරහිස මත්තෙහි රෙදි කඩක් (තුවායක් වැනි) පැළඳීමේ සිරිත චිත්‍රපටය තුළ හඳුනාගත හැකි ය. උරහිසේ දමන ලද මෙම රෙදි කඩ එවක ගෞරවනීය සංකේතයක් ලෙස සලකා ඇත. සිරිපා වන්දනාවේ යන බැතිමතුන්ගේ එක් උරහිසක පැළඳ ඇති සුදු රෙදි කඩ සමකාලීන සමාජයේ පැවති මෙකී ලක්ෂණ පිළිබිඹු කරයි.

එකල ලක්දිව වැසියෝ සිය ජීවිකාව පවත්වාගෙන යාම සඳහා විවිධ කර්මාන්තයන්හි නියැලෙමින් ආගම කේන්ද්‍ර කොටගත් ජීවන රටාවකට හුරු වූවෝ වූහ. සාමූහිකත්වය, සරල බව ඔවුන්ගේ ජීවිත තුළ නිරන්තරයෙන් පැවති ආකාරය චිත්‍රපටය තුළ හඳුනාගත හැකි ය. විශේෂයෙන් ම ජීවනෝපාය ක්‍රමවල දී එකිනෙකා සාමූහිකව කටයුතු කරන ආකාරය දක්නට ලැබේ.

*කඳුරට අගනුවර (Hill Capital) - 1951*

කලු සුදු - මි.මී 35
ධාවන කාලය - මිනිත්තු 30
අධ්‍යක්ෂණය, සංස්කරණය - ජුලියෝ පෙට්රෝනි
කැමරාකරණය, හඬ සම්පාදනය - ෆෙඩ්රිකෝ සෙරා
කථනය - වික්ටර් ලුවිස්

කඳුරට අගනුවර (Hill Capital) චිත්‍රපටය තුළින් මහනුවර නගරයේ සහ අවට ස්වභාව සෞන්දර්ය චමත්කාරජනක ලෙස නිරූපණය කිරීමට උත්සාහ දරා ඇත. පේරාදෙණිය උද්භිද උද්‍යානය තුළ රූගත දර්ශන තුළින් විවිධත්වයෙන් යුතු ශාක ප්‍රජාවත්, ස්වභාව සෞන්දර්යයේ අසිරියත් දිගු රූප මාලාවක් මගින් ඉදිරිපත් කර ඇත. එසේම කඳු පංතිවලින් වට වූ මහනුවර නගරය, බෝගම්බර වැව, මහවැලි ගඟ, අලි ස්නානය කිරීමේ දර්ශන යන මේ සියල්ල මගින් ලංකාවේ ස්වභාව සෞන්දර්යය විදේශයට ගෙනයාමෙහි ලා නිර්මාණකරුවා වාර්තා චිත්‍රපටය යොදාගෙන ඇති ආකාරය හඳුනාගත හැකි ය.

***සමාජ සංලක්ෂණ***

කඳුරට අගනුවර (Hill Capital) චිත්‍රපටය මහනුවර නගරය හා ඒ ආශ්‍රිත පරිසරය කේන්ද්‍ර කොටගෙන නිර්මාණය වූවකි. එකල ලංකාවේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වූයේ කෘෂිකර්මාන්තය යි. කඳුකර ප්‍රදේශය, හෙල්මළු ක්‍රමයට වී වගා කිරීම සඳහා සකසන ලද කෘෂිකාර්මික බිම් කඩක් ග්‍රහණය කර ගන්නා නිර්මාණකරුවා වී වගාව සම්බන්ධ මූලික අදියරේ කටයුතු සිදු කෙරෙන ආකාරය නිරූපණය කරයි. ගවයන් යොදාගෙන සී සෑම වැනි දර්ශන තුළින් යාන්ත්‍රික උපකරණ අවම වූ කෘෂිකර්මාන්තයේ මුල් කාලීන ලක්ෂණ හඳුනාගත හැකි ය.

මහනුවර නගරය කේන්ද්‍ර කොටගෙන ආරම්භ වූ ලංකාවේ පළමු විශ්වවිද්‍යාලය පේරාදෙණිය යි. එහි ප්‍රථම ගොඩනැගිල්ල කැමරාවට හසු කරගන්නා නිර්මාණකරුවා එමගින් ලංකාවේ අධ්‍යාපන ක්‍රමවේදය පිළිබඳ සාධක ගෙන හැර දක්වයි. උසස් අධ්‍යාපනය සඳහා මෙහි පවතින අවකාශය පිළිබඳව දැනුම්වත් කරමින් ලංකාවේ අධ්‍යාපනය සඳහා ප්‍රේක්ෂක අවධානය යොමු කරවීම එයින් අපේක්ෂා කර ඇත.

***සංස්කෘතික සංලක්ෂණ***

චිත්‍රපටයේ දර්ශනවලින් බහුතරයක් සඳහා ආගම තේමා වී ඇත. ලංකාතිලක විහාරය, දළදා මාලිගාව කේන්ද්‍ර කරගත් ආගමික ස්ථානවල බෞද්ධ බැතිමතුන් වන්දනා මාන කරන ආකාරයත්, ධර්මය සජ්ඣායනා කරන භික්ෂූන් වහන්සේලාත්, දේශීය බෞද්ධාගමික සිද්ධස්ථාන අතර මුදුන් මල් කඩ සේ සැලකෙන දළදා වහන්සේ ප්‍රමුඛ දළදා මැඳුරත් චිත්‍රපටයේ අන්තර්ගතය තුළ බෞද්ධාගමික පසුබිම නිරූපණයෙහි ලා විශාල කාර්යය භාර්යක් සිදු කරයි.

බෞද්ධාගමික සංස්කෘතිකාංග අතර දළදා පෙරහැරට ප්‍රමුඛස්ථානයක් හිමිවේ. උඩරට වෙස් ඇඳුම් පැළඳුම්වලින් සැරසුණු උඩරට නැටුම් කලාවත්, බෙර, දවුල්, රබන් යොදාගෙන ඉදිරිපත් කෙරෙන සාම්ප්‍රදායික නර්තනාංගත් දේශීය අනන්‍යතාව ලොවට රැගෙන යන සංස්කෘතිකාංග වේ.

නව පරම්පරාව වෙත දායාද කරනු වස් දේශීය අත්කම් කලාව, උඩරට නැටුම් ශිල්පය පුහුණු කරන දර්ශන දේශීය ශිෂ්ටාචාරයේ විචිත්‍රත්වය මෙන්ම සම්භාව්‍ය හර පද්ධතිය පරම්පරාවෙන් පරම්පරාවට රැගෙන යාම පෙන්නුම් කරයි. පෙට්‍රෝනිගේ තවත් වැදගත් කෘතියක් වූයේ මහනුවර ප්‍රදේශය පසුබිම් කොට නිපදවූ කඳුරට අගනුවර (Hill Capital) චිත්‍රපටය යි. මහනුවර ප්‍රදේශයේ ඓතිහාසික වැදගත්කමත්, ආගමික හා සංස්කෘතික වැදගත්කමත්, ස්වභාව සෞන්දර්යයත් අළලා ඉතා විශිෂ්ට සිනමා වාර්තාවක් ඔහු ඉදිරිපත් කරයි. නැටුම්, වැයුම්, කලා ශිල්ප ආදියේ ඔවුන් සතු අදීන සම්ප්‍රදායත්, එය රැකගැනීමට ඔවුන් ගන්නා වෙහෙසත් නිරූපණය වේ (රත්නවිභූෂණ, 2012, පි. 18).

එකල බෞද්ධාගමික සිද්ධස්ථානවල සිතුවම් කළ චිත්‍ර මගින් නුවර යුගයේ චිත්‍ර සම්ප්‍රදායත්, බිතු සිතුවම් කලාවත් ආගමානුකූලව පැවති බව මෙහි දී හඳුනාගත හැකි ය. එසේ ම මෙම චිත්‍රපටය තුළින් සාම්ප්‍රදායික ගැමි සමාජයේ ගැමි ජීවන රටාව මනාව නිරූපණය කර ඇත. අමුඩ ඇඳි ගොවීන් කෘෂිකර්මාන්තයේ නිරත වන රූප රාමු එදා හෙළදිව ගැමි ජනයාගේ ජීවනෝපායත් ඇඳුම් පැළඳුම් රටා තුළ පැවති සරලත්වයත් පිළිබිඹු කරයි. රෙදි හැට්ට ඇඳි කාන්තාවන් ද, සරොම් ඇඳි පුරුෂයන් ද එකල ලක්දිව පැවති සමාජ සංස්කෘතික ලක්ෂණ විදහාපාන සංකේත වේ.

*නෙළුම්ගම (Nelumgama) - 1953*

කලු සුදු - මි.මී 35
ධාවන කාලය - මි. 45
තිර රචනය, නිෂ්පාදනය සහ අධ්‍යක්ෂණය - රැල්ෆ් කීන්
සහය අධ්‍යක්ෂණය - ලෙස්ටර් ජේම්ස් පීරිස්
කැමරාකරණය - වින්සන්ට් පෙරේරා
කැමරා සහාය - මැක්ස්. ඩී. සොයිසා
සංස්කරණය - ජෝර්ජ් ස්ටුවර්ට්
කථනය - Greg Roszkowski
සංගීතය, හඬ සම්පාදනය - දේවා සූරියසේන, ලයනල් එදිරිසිංහ

***සමාජ සංලක්ෂණ***

ඉහත සාකච්ඡා කළ වාර්තා චිත්‍රපටවලින් ඔබ්බට දිවෙන ලක්ෂණ නෙළුම්ගම තුළ දක්නට ලැබේ. නෙළුම්ගම චිත්‍රපටය නිශ්චිත අරමුණක් කෙරෙහි ඉලක්කගතව කළ විධිමත් නිර්මාණයකි. ආරම්භක චිත්‍රපටවලට වඩා තියුණු සංවිධිත ලක්ෂණ නෙළුම්ගමෙහි දැකගත හැකි ය. මෙම චිත්‍රපටය නිර්මාණය වන කාලවකවානුව වන විට සියලු අංගවලින් සපිරි ගමක ලක්ෂණ නෙළුම්ගම තුළ හඳුනාගත හැකි ය.

නෙළුම්ගමෙහි ගම් වැසියන්ගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය කෘෂිකර්මාන්ත යි. වී වගාව හා වෙනත් වැවිලි ආශ්‍රිත ජීවන රටාවක පැවැත්ම පිළිබිඹු කරන දර්ශන පෙළක් චිත්‍රපටයේ අන්තර්ගත ය. නෙළුම්ගම මධ්‍යයේ ගැමි ජනයාගේ අවශ්‍යතා හා වුවමනා සපිරෙන වෙළඳපොළක් වේ. භාණ්ඩ හා සේවා සපයන මෙම කඩපොළ ගැමි ජනයා පොදුවේ ගැවසෙමින් කාලය ගත කළ සමාජමය අවකාශයක් විය.

ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුවක් ද නෙළුම්ගම තුළ දැකිය හැකි ය. කරත්තවල සිට මෝටර් වාහන දක්වා දිවෙන අගනගරයේ දර්ශන තුළින් සමකාලීන ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ තත්කාලීන ස්වරූපය හඳුනාගත හැකි ය.

මෙම වකවානුව වන විට සන්නිවේදනයේ ක්‍රමික දියුණුවක් පෙන්නුම් කෙරේ. වාහනයක සවි කරන ලද ශබ්ද විකාශන යන්ත්‍ර මගින් පොදු පණිවුඩ සන්නිවේදනය කරන ආකාරය මෙහි දී දැකිය හැකි ය. දේශපාලන ප්‍රචාරක ව්‍යාපාරය ගමට රැගෙන එන්නේ මෙබඳු පොදු සන්නිවේදන ක්‍රම භාවිතයෙනි. එසේම දේශපාලන ව්‍යාපාරය සඳහා පෝස්ටර් භාවිත කරන ආකාරය ද දක්නට ලැබේ. සරල ආකෘතියකින් නිර්මාණය කළ ඡන්ද පෝස්ටරයේ පක්ෂය, සලකුණ සහ කතිරය ලකුණ යොදාගනිමින් පොදු මහජනයා දැනුම්වත් කර ඇත. ප්‍රධාන සන්නිවේදන මාධ්‍යය ලෙස පුවත්පත ජනප්‍රියව පැවති බවට ද සාධක මෙහි දී හඳුනාගත හැකි ය. සෙසු වාර්තා චිත්‍රපට ද්විත්වයේ දක්නට නොලැබෙන ජන ජීවිතයේ නිදහස, අස්වැසිල්ල වින්දනය කරන ගැමියන් නෙළුම්ගමෙහි දැකිය හැකි ය. කඩපොළෙහි ගැමියන් එකට එක්ව දාම් ක්‍රීඩාවේ යෙදෙන රූප රාමු තුළින් නිර්මාණකරුවා ගැමි ජන ජීවිතයේ විනෝදාස්වාදය ග්‍රහණය කොටගෙන ඇත.

තෝරාගත් චිත්‍රපට හා සසඳන කල දේශපාලන ක්‍රමයක ක්‍රියාකාරීත්වය හඳුනාගත හැක්කේ නෙළුම්ගම තුළිනි. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක පැවැත්ම උදෙසා පවත්වනු ලබන මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයේ ක්‍රියාකාරීත්වය තුළ මෙම දේශපාලන ක්‍රමය පිළිබඳව අවබෝධ කර ගත හැකි ය. මැතිවරණය තුළින් තෝරා ගන්නා මහජන නියෝජිතයන්ගෙන් සැදුම් ලත් පාර්ලිමේන්තුව ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ කේන්ද්‍රස්ථානය බවත්, එමගින් රටෙහි පොදු තීරණ ගැනීමට කටයුතු කරන ආකාරයත් නිරූපිත ය. නෙළුම්ගමෙහි ස්ථාපිත කර ඇති පොලිස් ස්ථානය රටෙහි නීතිය හා සාමය රකිනු වස් ක්‍රියාත්මක රාජ්‍ය පාලන යාන්ත්‍රණයේ කොටසක් බව පෙන්නුම් කර ඇත.

මෙහි ස්ථාපිත බෙහෙත් ශාලාව ගැමි ජනයාගේ සෞඛ්‍ය සම්බන්ධ කටයුතු සඳහා මගපෙන්වන ස්ථානය යි. ඒ අනුව නෙළුම්ගම තුළ සියලු අංගවලින් සමන්විත විධිමත් පරිපාලන ක්‍රමයක ලක්ෂණ හඳුනාගත හැකි ය. එසේ ම පොදු අරමුණු ජය ගැනීම වෙනුවෙන් ඒකරාශී වූ ජන කොට්ඨාසයක ක්‍රියාකාරීත්වය ද නෙළුම්ගමෙහි දැකිය හැකි ය.

සමාජමය ලක්ෂණ වශයෙන් දැනුදු අප අත්දකින බහුතරයක් අංග නෙළුම්ගම තුළ දක්නට ලැබේ. එහි දී නිර්මාණකරුවා සංස්කෘතික සංලක්ෂණ අබිබවා සමාජ සංලක්ෂණ නිරූපණය කිරීමට කටයුතු කර ඇති ආකාරය මෙමගින් සනාථ වේ.

***සංස්කෘතික සංලක්ෂණ***

නෙළුම්ගම චිත්‍රපටය තුළ සංස්කෘතික ලක්ෂණ අබිබවා ගොස් සමාජ ලක්ෂණ ඉස්මතු වීම නිසා මිනිසුන්ගේ ඇදහිලි, විශ්වාස, ආගම වැනි ලෞකිකත්වය ඉක්මවා යන අධ්‍යාත්මික තේමා විෂය කොටගැනීම සීමාසහිත වී ඇත. සාම්ප්‍රදායිකත්වයට එහා යමින් දේශපාලනය වැනි සමාජීය සාධක පෙරට ඒමත්, නිර්මාණකරුවා අරමුණු කරගන්නා කතා පුවත ඉදිරිපත් කිරීමෙහි ලා විශ්වාස, ඇදහිලි, ආගම, චාරිත්‍ර වාරිත්‍ර, කලාව යනාදී සංස්කෘතිය තුළ වරනැගෙන අංගයන්ගේ සබඳතාව හීනවීමත් හේතුවෙන් නෙළුම්ගමෙහි සංස්කෘතික ලක්ෂණ හඳුනාගැනීම අසීරු ය.
නෙළුම්ගම තුළ වඩා සංවිධිත ආකාරයට නිර්මාණය වූ ගමක ලක්ෂණ හඳුනාගත හැකි ය. පැලැන්තිය හා රාජකාරී ස්වරූපය නිරූපණය කෙරෙන ඇඳුම් පැළඳුම් මෙම චිත්‍රපටය තුළ දැකිය හැකි ය. ආරච්චිල, පොලිස් නිලධාරීන් වැනි රාජ්‍යය යාන්ත්‍රණයට සම්බන්ධ පාර්ශව නිල ඇඳුම මගින් සංකේතවත් කර ඇත. එසේ ම පාලන යාන්ත්‍රණයට සම්බන්ධ මහජන නියෝජිතයන් සහ ආර්ථික ශක්තිය හිමි ව්‍යාපාරික පැලැන්තිය ද ඔවුනට ආවේණික වූ ඇඳුම් පැළඳුම් රටා සහිතව නිරූපණය කර ඇත. සාමාන්‍ය ජනයා සරම්, බැනියම්, රෙදි හැට්ට, සාරි, උඩරට ඔසරිවලින් සැරසී ඇති අතර, මෙමගින් සමකාලීන සමාජය තුළ පැවති වෘත්තීය මත පදනම් වූ ඇඳුම් පැළඳුම් රටා සහ ජන ජීවිතයේ බාහිර පෙනුම මැනවින් හඳුනාගත හැකි ය.

**නිගමනය**

දේශීය වාර්තා චිත්‍රපට කලාවේ ආරම්භක නිර්මාණවල සමාජ හා සංස්කෘතික ලක්ෂණ අධ්‍යයනයේ දී පෙනීයන වැදගත්ම කරුණ වන්නේ සමකාලීන සමාජය, සංස්කෘතිය, ගැමි ජීවිතය සහ ස්වභාව සෞන්දර්යය ප්‍රතිනිර්මාණයෙහි ලා නිර්මාණකරුවා පුළුල් අවධානයක් යොමු කර ඇති ආකාරය යි. තත්කාලීන තේමා විෂය කොටගැනීමේ දී වාර්තා චිත්‍රපට ශෛලියේ අනන්‍යතා මත පිහිටා නිර්මාණකරණයේ නියැලී ඇති ආකාරය මෙම චිත්‍රපට තුළින් පෙන්නුම් කෙරේ. එවක සමාජය තුළ පැවති ජීවනෝපාය ක්‍රම, අධ්‍යාපනය, ප්‍රවාහනය, සන්නිවේදනය, දේශපාලනය හා පරිපාලන ක්‍රමය, සෞඛ්‍ය යන සමාජ සංලක්ෂණ නිරූපණයෙහි ලා නිර්මාණ ත්‍රිත්වයේ අඩු වැඩි වශයෙන් අවකාශ භාවිත කොට ඇත. එකල ගැමි ජනයා සතුව පැවති සංස්කෘතික ලක්ෂණ විද්‍යමාන කිරීමෙහි ලා ප්‍රමුඛත්වයක් ලබා දී ඇති සිනමාකරුවා ක්‍රමිකව විධිමත්ව සංවර්ධනය වූ සමාජ ලක්ෂණ විශද කිරීමට

වාර්තා චිත්‍රපටය යොදාගෙන ඇත. අධ්‍යාපනයෙන් නොදියුණු ප්‍රාථමික ජන සමාජයේ ගැමි ජනයා සතුව පැවති ඇදහිලි හා විශ්වාස පදනම් වූ සමාජ ක්‍රමයේ ක්‍රියාකාරීත්වයත්, ආගම හා සාරධර්මවලින් ගැමි ජනයා පාලනය කරන ආකාරයත්, චාරිත්‍ර වාරිත්‍ර මුල් කොටගත් සදාචාරවාදී සමාජ ක්‍රමයක ක්‍රියාකාරීත්වයත්, මෙම චිත්‍රපටවල නිරූපිත දර්ශන මගින් පැහැදිලිව හඳුනාගත හැකි ය. ආගම මගින් පෝෂණය වූ කලාවක පැවැත්මත්, දේශීයත්වය ඉස්මතු වූ ඇඳුම් පැළඳුම් හා ජීවන රටා මගින් ලාංකේය සංස්කෘතියත්, දේශීය අනන්‍යතාවත් ප්‍රමාණාත්මක ලෙස විශද කිරීමට නිර්මාණකරුවා ගෙන ඇති උත්සාහය තුළ සමකාලීන සමාජ ස්වභාවයත්, සංස්කෘතියක් තත්වාකාරයෙන් හඳුනාගත හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

කුමරපේලි, ටී. (2007). *සංස්කෘතික සන්නිවේදනය.* ගොඩගේ ප්‍රකාශකයෝ.

ගුණරත්න, එස්. (2014). *ජන සංස්කෘතියෙහි ලා ආචාරධර්මීය ප්‍රවේශයක්. රූපවාහිනී සමීක්ෂා*, හත්වන කලාපය.

ගුණසේකර, යූ, ජී. (2012). *ශ්‍රී ලාංකේය ඡායාරූප වංශය.* සරසවි ප්‍රකාශයෝ.

ජයමාන්න, පී. (2000). *ලංකා ගීතය විචාරක ඇසින්. සදිසි* (ජූලි - සැප්තැම්බර්).

ද සිල්වා, එස්., (2012). වාර්තා චිත්‍රපටයේ අර්ථකථන හා සීමා පිළිබඳ හැඳින්වීමක්. තුළ ඒ. ඇතුගල සහ ඒ. රත්නවිභූෂණ (සංස්.), *ප්‍රතිබැහැදැක්ම.* රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

පල්ලියගුරු, සී. (2000). *සංස්කෘතියේ සමාජ මුහුණුවර.* සිරිගුරු.

පෙරේරා, ආර්. (2023). *සමාජ ප්‍රශ්න.* සරසවි ප්‍රකාශයෝ.

පෙරේරා, ටී. (2021). *සමාජ විද්‍යාව.* නුවණී ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස්.

නිහාල්, බී. (2014). *සිනාරියෝ වාර්තා චිත්‍රපටකරණය.* බර්ට් පබ්ලිකේෂන්.

රත්නවිභූෂණ, ඒ. (2012). සම්භාවනීය වාර්තා සිනමාකරුවා ප්‍රඥාසෝම හෙට්ටිආරච්චි. තුළ ඒ. ඇතුගල සහ ඒ. රත්නවිභූෂණ (සංස්.), *ප්‍රතිබැහැදැක්ම.* රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

රත්නවිභූෂණ, ඒ. (2012). විශිෂ්ට වාර්තා සිනමා සම්ප්‍රදායයකට කැප වූ රජයේ චිත්‍රපට අංශය. තුළ ඒ. ඇතුගල සහ ඒ. රත්නවිභූෂණ (සංස්.), *ප්‍රතිබැහැදැක්ම.* රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

වේරගම, පී. (2000). *වාර්තා චිත්‍රපට කලාව.* සදිසි (ජූලි - සැප්තැම්බර්).